# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2125/66 - 2019 මැයි මස 31 වැනි සිකුරාදා - 2019.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

නියෝග අංක 54

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

20(5) වැනි වගන්තිය යටතේ නියෝගය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20(5) වගන්තිය යටතේ ක්‍රියා කරමින් කිසිම නිෂ්පාදකයකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දකු විසින් පහත දක්වා ඇති සහල් වර්ග එහි සඳහන් උපරිම සිල්ලර මිලට වඩා ඉහළ මිලකට වෙළඳාම් කිරීම, වෙළඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම, වෙළඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මෙයින් නියෝග කරනු ලැබේ.

| *වර්ගය* | *උපරිම සිල්ලර මිල* |
|---|---|
| සුදු සම්බා - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද - දේශීය (කීරි සම්බා හා සුදුරු සම්බා හැර) | කිලෝ ග්‍රෑම් 1 ක් රු. 85/- |
| සුදු නාඩු - තම්බන ලද/වාෂ්පයෙන් තැම්බූ - දේශීය (මොට්ටයිකරුපන් හා ආට්ටකාරි හැර) | කිලෝ ග්‍රෑම් 1 ක් රු. 80/- |
| රතු නාඩු - තම්බන ලද/වාෂ්පයෙන් තැම්බූ - දේශීය (මොට්ටයිකරුපන් හා ආට්ටකාරි හැර) | කිලෝ ග්‍රෑම් 1 ක් රු. 74/- |

මෙම නියෝගය 2019 මැයි මස 31 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2017 දෙසැම්බර් මස 26 වැනි දින අංක 2051/8 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝග අංක 49 මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

ආචාර්ය, ලලිත් එන්. සෙනවීර,
සභාපති.

2019 මැයි මස 31 වැනි දින,
කොළඹ දී ය.

06 - 433

1A - PG 4537 — 217 (2019/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*